දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 31 /2010

මගේ අංක: එස්ටීපී/පීඑස්/ 2010

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09,

2010.11. 16 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ සහකාර අධිකාරින් වෙත.

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක: එෆ්අයිඑන්/1051/එෆ්/192/18/එබී/ඩී හා 1985.06.18 දිනැති චක්‍රලේඛ ලිපියේ දෙවන (2) ඡේදයට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එහි දෙවන ඡේදය අනුව 2010 පාලන වාර්තාව 2011 මාර්තු 01 වන දිනට ප්‍රථම මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතුව ඇත.

03. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සෑම ආයතනයකින්ම වාර්තා ලබාගෙන සංඛ්‍යා දත්ත වක්‍රගත කොට වාර්තා සම්පිණ්ඩනය කර දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කලයුතු වේ.

04. එම නිසා ඔබ ආයතනයේ 2010 සංඛ්‍යාලේඛන වාර්තාව 2011 ජනවාරි 31 දින හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සලස්වන මෙන් දන්වමි. නිවැරදි , පැහැදිලි හා සංසන්දනාත්මක දත්තයන් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම බව සැලකිය යුතුය.

05. සංඛ්‍යාලේඛන වාර්තාව සකස්කිරීමට අදල ආකෘතිපත් මේ සමග එවා ඇති අතර,එහි පිටපතක් ඔබ කාර්යාලයෙහිද තබාගැනීමට වගබලා ගතයුතුය.

06. 2010 වාර්ෂික සංඛ්‍යාලේඛණ වාර්තාවන් ලැබුණු බව දන්වන්න.

වී.ආර්.සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජ්
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්